ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයට අනුබද්ධිත ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි.
Sri Lanka Cultural Education Centre attached to the Consulate General of Sri Lanka, Dubai
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංක E/A.D./ද.ප./ලි/001

2017 ජනවාරි 10 යොමු අංකය 1617-023

දයාබර දෙමාපියන් වෙත,

**<u>තාවකාලිකව නවත්වන ලද දහම් පාසැල් අධ්‍යයන කටයුතු නැවත ආරම්භ කිරීම</u>**

දහම් පාසලේ දෙමාපියන් වෙත 2017 දෙසැම්බර් මස 25 දින 1617-022 දරන දැන්වීමෙන් දන්වා එවූ පරිදි දහම් පාසල පවත්වාගෙන යාම සඳහා ඇතිවූ ගැටළු සහගත තත්වය තාවකාලික පදනමක් තුල ඉතා සුවිශේෂ කොන්දේසි යටතේ 2017 ජනවාරි මස තුල නැවත ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු යොදාගෙන යන බව දැනුම් දෙමු.

කොන්සල් ජනරාල් කාර්යාල පරිශ්‍රයේ පිහිටි දහම් පාසල් ශාලාවේ පන්ති පවත්වාගෙන යාම සඳහා එම ගොඩනැගිලි හිමියන්ගෙන් අවසර ලබාගැනීම සඳහා ඔවුන් විසින් පනවන ලද කොන්දේසි පහත සඳහන් වේ.

1. කොන්සල් ජනරාල් කාර්යාලය පරිශ්‍රය අවට ප්‍රදේශවාසීන් අපහසුතාවයට පත් වනසේ වාහන ගාල් කිරීම සහ මාර්ගයේ අවහිර වනසේ නවතා නොතැබීම
2. වෙළඳ ප්‍රවර්ධන ප්‍රචාරණ කටයුතු සඳහා කොන්සල් ජනරාල් කාර්යාලය අවට පරිසරය යොදා නොගැනීම.
3. දහම්පාසල පැවැත්වෙන අවස්ථාවන් හි දී අවට ප්‍රදේශවාසීන්ට බාධා පැමිණෙන ආකාරයට කණ්ඩායම් වශයෙන් එම නිවෙස් අවට කාලය ගත නොකිරීම.

ඉහත කොන්දේසි එකක් හෝ කඩකිරීම වසර 15 තිස්සේ පවත්වාගෙන ආ දහම් පාසල සම්පූර්ණයෙන්ම වසා දැමීමට හේතු වන බව දෙමාපියන් වන ඔබ සියලු දෙනා වෙත නැවතත් අවධාරණය කර සිටිමු.

ජාතික මෙහෙවරක් ලෙස අප දරුවන් දහස් ගණනකට අපේකම ඉගැන්වූ දහම් පාසල මින් ඉදිරියට පවත්වාගෙන යාමට නම් මෙතෙක් අනුගමනය කල ක්‍රමවේදයේ සම්පූර්ණ වෙනසක් සිදු කල යුතු බව ද ඒ සඳහා සියලුම දෙමාපියන්ගේ පූර්ණ අවබෝධය සහ කොන්දේසි විරහිත කැපවීම බලාපොරොත්තු වන බවද සඳහන් කරමු. ඒ සඳහා පහත දැක්වෙන ක්‍රියාමාර්ගයන් ගැනීමට තීරණය කර ඇත.

1. සියලුම දෙමව්පියන් දහම්පාසලේ නව කොන්දේසි මාලාවකට එකඟ විය යුතු අතර සියලුම දරුවන් ඒ යටතේ නැවත ලියාපදිංචි කල යුතුය.
2. නැවත ලියාපදිංචි නොකළ දරුවන් දහම් පාසලට ඇතුලත් කර ගනු නොලැබේ.
3. ලියාපදිංචියට පැමිණෙන විට දරුවාගේ ‘ශිෂ්‍ය වාර්තා පොත’ අනිවාර්යයෙන් ගෙන ආ යුතුය.

මෙතැන් සිට ක්‍රියාත්මක කෙරෙන වැඩ පිළිවෙල සම්භන්ධයෙන් සහ නව කොන්දේසි මාලාව පිළිබඳව ඔබ සියලු දෙනා දැනුවත් කිරීම සඳහා 2017 ජනවාරි මස 13 වැනිදා සිකුරාදා පෙරවරුවේදී විශේෂ රැස්වීමක් කොන්සල් ජෙනරාල් තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන අතර ස්ථානය සහ වෙලාව පසුව දැනුම් දෙනු ලැබේ. එම අවස්ථාවේදීම දරුවන් සඳහා වූ නව ලියාපදිංචි කිරීම සඳහාද කටයුතු යොදා ඇත. මෙය සියලුම දරුවන් සඳහා අනිවාර්‍ය වන අතර නැවත ලියා පදිංචිය සම්පූර්ණ කල දරුවන් හට පමණක් නැවත දහම් පාසල ආරම්භ කල පසු පන්ති සඳහා සම්බන්ධ වීමට අවසර ලැබෙනු ඇත. මේ සමග අමුණා ඇති කොන්දේසි සහිත පත්‍රිකාව හොඳින් කියවා, අත්සන් කර රැස්වීමට පැමිණෙන විට රැගෙන විත් සංවිධායක මණ්ඩලයට භාර දෙන්න.

මෙම විශේෂ රැස්වීමට දරුවන්ගේ පැමිණීම අවශ්‍ය නොවන බවත් එක් පවුලකින් මව හෝ පියා පමණක් සහභාගී වීම ප්‍රමාණවත් වන බවත් කරුණාවෙන් දන්වා සිටිමු.

ස්තුතියි,

සංවිධායක මණ්ඩලය

Sri Lanka Consulate General Office, No. 2, Street 322-B, Al Hudaiba, Dubai, UAE. Postal: PO Box 51528, Dubai, UAE.
TP. +971 4 3986535, Fax: +971 4 3984687, E Mail: dahampasaladubai@gmail.com, Web: http://www.dhahampasala.org